# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVII | NOVEMBER 2023 | Issue No. 12

## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 138:1-8)**

01. මගේ මුළු සිතින් ඔබට ස්තුතිකරන්නෙමි. දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගීයෙන් ප්‍රශංසාකරන්නෙමි.

02. ඔබගේ ශුද්ධ මාළිගාව දෙසට නමස්කාරකරමින්, ඔබගේ කරුණාගුණය සහ සත්‍යය නිසා ඔබගේ නාමයට ස්තුතිකරන්නෙමි. මක්නිසාද ඔබගේ මුළු නාමයට ඉහළින් ඔබගේ වචනය උතුම්කළ සේක.

03. මා ඔබට අඬගැසූ දවසේදී ඔබ මට උත්තරදී, මාගේ ආත්මය ශක්තිමත්කොට ධෛර්යදුන්සේක.

04. ස්වාමිනි, පොළොවේ සියලු රෑ රජවරු ඔබගේ මුඛයේ වචන ඇසූ බැවින් ඔබට ස්තුතිකරන්නෝය.

05. එසේය, ස්වාමීන්ගේ මහිමය උතුම් නිසා, ඔව්හු ස්වාමීන්ගේ මාර්ගය ගැන ගීතිකාකරන්නෝය.

06. මක්නිසාද ස්වාමීන්වහන්සේ උසස් නුමුත් පහත් අය සලකනසේක. නුමුත් උඩඟු අය දුරදීම දන්නාසේක.

07. මම විපත්ති මැද හැසිරෙම් නුමුත් ඔබ මා ප්‍රාණවත්කරනසේක; ඔබ මාගේ සතුරන්ගේ උදහසට විරුද්ධව ඔබගේ හස්තයද දිගුකරනසේක, ඔබගේ දකුණු හස්තයද මා ගළවන්නේය.

08. ස්වාමීන්වහන්සේ මා සම්බන්ධ කාරණය සම්පූර්ණකරනසේක. ස්වාමිනි, ඔබගේ කරුණාව සදාකල් පවත්නේය; ඔබගේම හස්තකර්ම අත් නොහළ මැනව.

# ඔබගේ සටන තෝරාගන්න.

## RECOGNIZE YOUR BATTLE FIELD!

(පාස්ටර් ඒන්ජල් සෙල්වකුමාරි)



මෑතකදී මගේ මිත්‍රයෙක් මුණගැසීම පිණිස මාගේ පවුලේ අය සමඟ ගියෙමි. මා බොහෝ කාලයක් පුරා නොදැක්ක නිසා ඉතා උද්යෝගීමත්ව මෙම ගමන ගියෙමි. මේ වන විට මාර්ග වෙනස් වී ඇති නිසා Google සිතියම හරහා නිවැරදි මාර්ගය සොයා ගන්න පිණිස ක්‍රියා කලෙමි. නමුත් අවසානයේදී මට එම මාර්ගය සොයා ගැනීමට නොහැකි විය. Google සිතියම මට උපකාර කිරීමට උත්සාහ කල මුත් එය වැරදුනි. මා වටයක් කැරකී මාර්ගයෙහි ගමන් කල නිසා මාගේ ඉවසීමද නැති විය.

මෙවැනි අත්දැකීම් ඔබ බොහෝ දෙනෙකුට ඇත. පසුව මා මාර්ග සංඥා පුවරුව අසල සිටින විටදී Google සිතියමෙහි ඉතා කෙටි පාරක් පෙන්නුවේය. එම පටු පාරෙහි වාහනයක් යාමට හැකිදැයි කියා මට මතකයේ නොතිබුණි. එම නිසා යතුරු පැදියක ගමන් කල පුද්ගලයෙකුගෙන් මා එම මාර්ගය ගැන විස්තර ඇසුවෙමි. ඔහුත් එම මාර්ගයේම සිටින නිසා ඔහු පසුපින් එන්න කියා පැවසුවේය. මා ඔහු පසුපස ඔහුව අනුගමනය කරමින් ගමන් කල මුත් මගේ සැකය එසේම පැවතුනේය. කෙසේ වෙතත් Google සිතියම පෙන්වන මඟපෙන්වීම අමතක කර දමා මා එම පුද්ගලයා පසුපස ගමන් කලෙමි. ඔහු එම මාර්ගය පිළිබඳව ඉතා හොඳින්ම දැන සිටියේය. මෙවැනි පාරක් දන්නාවූ කෙනෙක් සමඟ ඔහුව විශ්වාස කරමින් ඔහුගේ මගපෙන්වීමට අනුව ගමන් කිරීම ඉතාම පහසු විය.

3 වෙනි පිටුවට ...



**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**


Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## *from your dearly beloved brother...*

REACHING NATIONS





# කැඳවීමේ ප්‍රතිරාවය



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Bro. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

"නුඹලාට දයාවත්, සමාදානයත් හා ප්‍රේමයත් වැඩි වේවා."
(යූදස් 1:2)

**ස්වාමීවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රේමනීය සහෝදර සහෝදරයි,**



*Sis. Sajini Cherian*

ස්වාමීවු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව ඔබ සමඟ පවතීවා. ඔබ ඉතා සුවසේ සිටියි කියා අප විශ්වාස කරමු. ඔබගේ අවශ්‍යතාවයන් උදෙසා අප දිගටම යාච්ඤා කරමු. කැඳවීමේ ප්‍රතිරාවය සේවයට ස්වාමීන්වහන්සේ කරන්නාවූ සෑම සැපයීම ගැන අපි ස්වාමීන්වහන්සේට ස්තුති වන්ත වෙමු. අපගේ මෙම සඟරාවේ ඉංග්‍රීසි භාෂාවේ කර්තෘ වන සචිනි චෙරියන් සම ඇෆ්රිකානාස් භාෂාවේ කර්තෘ වන සහෝදර විලියම් ජේකබ් ගැනත් අපි දෙවියන්වහන්සේට විශේෂයෙන්ම ස්තුති කරමි. මේ දෙදෙනාවම දෙවියන්වහන්සේ අපගේ සේවයට එකතු කර තිබේ. එසේම අනෙකුත් සහයක කර්තෘවරුන් ගැනද අපි දෙවියන්වහන්සේ ට ස්තුති වන්ත වෙමු.



*Bro. Willem Jacobus Pretorius*

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ගැන අපට ඉතා යහපත් වූ ප්‍රතිචාර ලැබී තිබේ. මුළු ලෝතලය පුරාම විසිරී සිටින්නාවූ බොහෝ අයට දෙවියන් වහන්සේව අත්‍යාවශ්‍යව ඇත. ස්වාමීන්වහන්සේගේ රාජ්‍ය ගොඩනැගීමට අපවත් කොටස්කරුවන් ලෙස පාවිච්චි කිරීම ගැන අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු.

අප ඔබට කලින් දැක්වූ ලෙස මේ කාලය තුලදී අප විවිධාකාර ආත්මික සටන් වලට මුහුණ දෙමින් සිටිමු. එම නිසා අප ගැන විශේෂයෙන් යාච්ඤා කරන්නය කියා ඉල්ලමු.

අප මුහුණදෙන්නාවූ සෑම ගැටළුකාරී තත්වයන් තුළින් අප දිගටම ඉදිරියට ගමන් කරමින් සිටිමු. එසේම ඔබගේ යහපත උදෙසා අපි යාච්ඤා කරමු. ලෝකයේ සියලුම දේ දිනෙන් දින වෙනස්වෙමින් පවතී. නමුත් දෙවියන්වහන්සේගේ මෙහෙකරුවන් වන අප මේ ලෝකයේ සිටින්නාවූ සෙනඟ තුලට දෙවියන්වහන්සේගේ ආලේපය ලැබෙන්නය කියා යාච්ඤා කල යුතුය ඇත. අප ආත්මික යුද්ධයක යෙදී සිටින නිසා අපගේ නායකයා වූ යේසුස් වහන්සේ මේ සෑම යුද්ධයකින්ම අපට ජය ගෙන බව විශ්වාස කරමු. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

ඔබගේ ජීවිතයේද ඔබ මෙවැනිම වූ අත්දැකීම හරහා ගමන් කර තිබේද? කිසියම් කෙනෙක් ඔබට මාර්ගය පෙන්වන විටදී ඔබ ඔහුව අනුගමනය කර තිබේද? කෙසේ නමුත් ඔබ විශ්වාස කලත් නැතත් ඔබට මඟපෙන්වීමට කෙනෙක් ඇත. ඔහුගේ නම යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. උන්වහන්සේ ඔබගේ අතීතයත් ඔබගේ වර්ථමානයත් හා ඔබගේ අනාගතයත් ඉතා හොඳාකාරයෙන්ම දනී. අපගේ හෙට දවස ගැන උන්වහන්සේ දනී. අපගේ ජීවිතයට කිසියම් දෙයක් වෙන්නට පෙරම උන්වහන්සේ ඒ සියල්ලම දනී. ***මන්ද උන්වහන්සේ මේ ලෝකය මැවීමටත් පෙරම අපව දන්නාවූ ස්වාමීන්වහන්සේය. (එපීස 1:4)*** අප සෑම කෙනෙකු ගැනම ඉතා අලංකාරවූ සැලැස්මක් උන්වහන්සේ තබා තිබේ. ***''මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේ දී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමීන්වහන්සේ කියන සේක.'' (යෙරෙමියා 29:1)***

අපගේ ජීවිතයේ කුමන දෙයක් සිදු වුවත් සර්වබලධාරී වූ දෙවියන්වහන්සේ අප ගැන තබා තිබෙන්නාවූ සැලැස්ම අප අනුගමනය කල යුතුයි. අපගේ ජීවිතයේ ආර්ථිකමය ප්‍රශ්න, අභියෝග හා අප නොසිතූ සිදුවීම් සිදුවිය හැක. නමුත් මේ සියල්ලේදී ස්වාමීන්වහන්සේගේ මඟපෙන්වීම අපට තිබෙන බව අප විශ්වාස කල යුතුය.

## (1). කනස්සල්ලට පත් නොවී යහපත් යුද්ධ භටයෙක් ලෙස යහපත් වූ සටනෙහි සටන් කරන්න.

දෙවියන්වහන්සේගේ කැමැත්තනම්, අපගේ ජීවිතයෙහි අප මුහුණදෙන්නාවූ සෑම අභියෝගමත්, අවස්ථාවකදීම අමාරුවකදීම අමාරු කාලවකවානුකදීම හා කලබලකාරී සෑම අවස්ථාවකදීම අප කනස්සල්ලට පත් නොවී යුධ භටයෙකු ලෙස අපට පැමිණෙන්නාවූ සෑම පීඩාවකදීම සටන් වැදීමයි. බොහෝ විට අපට පැමිණෙන්නාවූ ප්‍රශ්න හා කරදර තුළින් අප පරාජයට මුහුණ දෙනවාය කියා සිතමු. නමුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ ලෝකයට පැමිණ කුරුසිපත් වී මළවුන්ගෙන් නැගිටුනේ අපට සදාකාල ජීවනය දෙන පිණිස බව අප අමතක නොකල යුතුය. අප අත්දකින්නාවූ සෑම දේම ස්වාමීන්වහන්සේගේ ස්වරූපයට වෙනස් කරන බව අප විශ්වාස කරමු. ***(2 කොරින්ති 3:18) පාවුලුතුමා මෙසේ පවසයි. අපගේ ඉලක්කය වන්නේ සදාකාල ජීවනයට ඇතුලුවීමයි. (1 තිමෝති 6:12) එම නිසා අප සියලු දෙනා කැඳවීම ලබා තිබෙන්නේ, යහපත් වූ සටනක් සටන් කිරීමටයි.***

ශුද්ධවූ පාවුලු තුමා ප්‍රකාශ කළ වචනය නම්, ''ඇදහිල්ලේ යහපත් සටනෙන් සටන්කොට සදාකාල ජීවනය අල්ලාගනින්න, ඊට නුඹ කැඳවනු ලැබ බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කර සිටියෙහිය.''

මෙම සටන අප සටන්කරන්නේ කෙසේද? එනම්, මෙම සටන අපට ජයගත හැක්කේ ඇදහිල්ල කරණකොට පමණි. ඇදහිල්ල නොමැතිව මෙම ධර්මිශ්ඨකමේ සටන ජය ගැනීමට බැරිය. අපට සදාකාල ජීවනයද උරුමකර ගැනීමටද නොහැකිය. ***ගීතාවලිය 144:1*** හි ඉතා අලංකාර දෙයක් සඳහන් කරයි. ***''යුද්ධයට මාගේ අත්ද සටනට මාගේ ඇඟිලිද පුරුදු කරන්නාවූ මාගේ පර්වතය වූ ස්වාමීන්ට ප්‍රශංසා වේවා.''*** අපව යුද්ධයට පුහුණු කරනු ලබන්නේ ස්වාමීන්වහන්සේමය.



*God trains my fingers for battle*

උන්වහන්සේ සේනාවල ස්වාමීන්වහන්සේය. අපගේ ජීවිතයේ සියමලු අභියෝගයන් වලට සටන්කාමීව මුහුණ දීමට උන්වහන්සේ බලය ගෙන දෙන සේක. ***නික්මයාම 15:3*** හි මෙසේ පවසයි. ***''ස්වාමීන්වහන්සේ යුද්ධ දක්ෂයෙක. උන්වහන්සේගේ නාමය ස්වාමීන් වහන්සේය.''*** අප ගැන උන්වහන්සේගේ කැමැත්ත නම්, අප කනස්සල්ලට පත් නොවී උන්වහන්සේ මෙන් යුද්ධයෙහි දක්ෂයෙකු වීමයි. අපට මඟපෙන්වීමටත් අප වෙනුවෙන් යුද්ධයෙහි සටන් කරන්නාවුන් සියල්ල දන්නාවූ තැනැන්වහන්සේ එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප සමඟ සිටියි. අප සටන් කරනු ලබන්නේ යේසුස් වහන්සේ තුළින් ජය ගන්නාවූ සටනයි.

## (2). සටන් කිරීමේ ආයුධය

අපගේ මෙම සටන සටන් කරණ පිණිස උන්වහන්සේ අපට බලවත් ආයුධයක් දී තිබේ. මෙම ආයුධය ගැන 1 කොරින්ති 10:4 හි මෙසේ සඳහන් කර තිබේ. ***''මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය.''***

මෙම යුද්ධායුධ ඉතාම බලවත් වන අතර ඒවා බලකොටු බිඳහෙලීමටත් එය පාපයද පාපයේ බැමි එසේත් නොමැති නම් පරම්පරා ගත ශාපයද යන සියල්ල පරාජය කිරීමට දෙවියන්වහන්සේ දුන් ආයුධය මෙයයි. ඔබගේ ජීවිතයේ එසේත් නැතිනම් ඔබගේ පවුල තුළ දිගින් දිගටම ලෙඩ රෝග හෝ කරදර වලට මුහුණ දෙමින් තිබේ නම් මෙම ආයුධය රැගෙන සටන් කරන්න. කල්වාරි කුරුසියේදී ගලා ගියාවූ යේසුස්වහන්සේගේ ලේ කරණකොට ගෙන ජය ප්‍රකාශ කරන්න. අප මෙම ආයුධ පාවිච්චි කරන විට දෙවියන්වහන්සේ අප වෙනුවෙන් සටන් කරයි.

### සියලු සටන් අප සටන් කිරීමට අවශ්‍ය නැත.

සමහර සටන් හා අභියෝගයන් අපව ප්‍රධාන සටනින් නොමඟට ගෙන යාමට උත්සාහ දරයි. එම නිසා අප ඉතා ප්‍රඥාවන්ත ලෙස කලයුතු සටන් මොනවාද කියා තෝරා බේරා ගත යුතුය. අනවශ්‍ය සටන් සටන් කර ඔබගේ කාලය හා ශක්තිය නාස්ති කර නොගන්න. අපගේ ජීවිත වලට එරෙහිව පැමිණෙන සියලු සටන් සමඟ සටන් කරමින් සිටිනවා නම්, අප ඉතාම බෙලහීනවූ තත්ත්වයට පත්වෙනු ඇත. දෙවියන්වහන්සේ අපව සටන් කිරීමට කැඳවා තිබෙන සටන අපට අමතක වෙයි. එබැවින් ඔබ සටන් කල යුතු සටන් පමණක් කුමක්ද කියා තෝරාගන්න.

### කැඳවීම මහත් නම් ඔබට පැමිණෙන අභියෝගයත් විශාල වෙයි.

ස්වාමීන්වහන්සේ ඔබට යමක් ඉෂ්ඨ කරන පිණිස කැඳවා තිබේ නම්, එසේම උන්වහන්සේගේ මහා ආඥාව අප පිළිපැදීමට ඕනි නම්, එයට බාධා කරන පිණිස බොහෝ අභියෝගයන් අපේ ජීවිතයට පැමිණෙනු ඇත. නමුත් අභියෝග දෙස පමණක් අප බලා සිටීනම් දෙවියන්වහන්සේ අපට දී තිබෙන්නාවූ ආශිර්වාදයන් අප නැති කර ගනී.

1 සාමුවෙල් පොතෙහි දාවිත් හා ගොලියත්ගේ කථාව පිළිබඳව සඳහන් කර තිබේ. මෙම කථාව අප ඉතා හොඳින්ම දන්නාවූ කථාන්දරයකි.

ගොලියත් ඉශ්‍රායෙල් හමුදාවට අභියෝග කරමින් ඔහු සමඟ සටනට එන්න කියා පවසමින් දින 40 ක් පුරාවටම එම ස්ථානයෙහි සිටියේය. එම නිසා ඉශ්‍රායෙල්වරු අතර විශාලවූ භයක් හටගත්තේය. ***"සියලු ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ ඒ මනුෂ්‍යයා දුටු විට බොහෝ සෙයින් භයවී ඔහු ඉදිරියෙන් දිවවෝය." (1 සාමුවෙල් 17:24)***

නමුත් මෙහිදී දාවිත්ගේ ප්‍රතිචාරය දෙස බලමු. ***"...ජීවමාන දෙවියන්වහන්සේගේ සේනාවලට මඟ කියන මේ අචර්මච්ඡේදිත පිලිස්තියා කවුදැයි කීවේය." (1 සාමුලේ 17:26)*** ගොලියත්ගෙන් මෙය ඇසුවිට දාවිත්ට ඉවසිය නොහැකි විය. අප ඉතා විමසිල්ලෙන් යුතුව මෙය දෙස බැලුවහොත් දාවිත් මෙම මනුෂ්‍යයාට භය නොවී ඔහු සමඟ සටන් කිරීමට සැලසුමක් යෙදුවේය.

දාවිත්ගේ ඇස් ඉදිරියෙහි තිබූ සටන ඔහුගේ නොව දෙවියන්වහන්සේගේ බව ඒත්තු ගත්තේය.

බොහෝ අවස්ථාවන් වලදී සටන අපගේ අතෙහි තබා ගැනීමට අප උත්සාහ දරයි. නමුත් අප එම සියලු සටන් සටන් කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දිය යුතුය. ප්‍රිය මිත්‍රය ඔබගේ ජීවිතයෙහි ඇති සියලු සටන් දෙවියන්වහන්සේට භාර දෙන්න. උන්වහන්සේ ඔබ වෙනුවෙන් සටන් කරයි. අද අප බොහෝ දෙනෙක් අපම සටන් කිරීමට අවශ්‍ය මාර්ග සොයාගෙන යන බැවින් ඉතා බෙලහීන වූ තත්ත්වයකට පත්ව සිටී. එම නිසා අපගේ ඇදහිල්ල අප දෙවියන්වහන්සේට භාර දිය යුතුයි. මන්ද සටන අපගේ නොව සටන දෙවියන්වහන්සේගේය.

### (3). සියල්ල යහපතට සිදුවෙයි.

ප්‍රිය සහෝදරයා සහෝදරිය, දාවිත්ව සටන් බිමට ගෙන ඒමට දෙවියන්වහන්සේට අනර්ඝවූ සැලැස්මක් තිබුණි. දාවිත්ට සටන් බිමේ සිටි තම සහෝදරයාට කෑම ගෙනවිත් දීමට අවශ්‍යයි කියා සිතූ නමුත් දෙවියන්වහන්සේට ඔහු ගැන සැලසුම වූයේ වෙනස් වූ ආකාර දෙයකි. දාවිත්ව ඉශ්‍රායෙල්හි රජෙක් ලෙස පත් කිරීමේ පළමු පියවර වූයේ මෙම සටනයි. එම අවස්ථාවේදී දාවිත් මේ ගැන දැන සිටියේ නැත. දාවිත් කෙරෙහි දෙවියන්වහන්සේගේ අනර්ඝවූ සැලැස්මක් හා ඔහුට දෙවියන්වහන්සේගේ ආශිර්වාදයත් තිබුණි. නමුත් සටන නැමති අභියෝගයට මුහුණ දීමට දාවිත්ට සිදුවිය. අපට පැමිණෙන්නාවූ සටන් අපව විනාශ කරනවාය කියා අප සිතුවත් අපගේ සටන් හා අභියෝග තුළ දෙවියන්වහන්සේගේ යහපත්කම සැඟවී තිබේ. මන්ද ඉදිරි සැඟවී තිබෙන ආශිර්වාද වලට පියවරක් ලෙස අපගේ සටන් ක්‍රියා කරයි.



*David fought with Goliath*

*6 වෙනි පිටුවට....*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**නොවැ: 19-** නෙහෙමියා බයිබල් විදුහලේ 2023 අධ්‍යයන වර්ෂය සම්පූර්ණ කිරීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 20-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැනත් ඒවා බෙදාහැරීමට හැකිවීම ගැනත් ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 21-** රෝහල් සේවය තුළින් සිදුවන හාස්කම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 22-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ප්‍රධාන සභාව සහ ශාඛා සභා තුළින් සිදුවන ශුභාරංචිය ප්‍රකාශ කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 23-** ශුභාරංචි සේවය උදෙසා පාස්ටර් සෑම් සෙල්වරාජ් දක්වන අසීමිත උනන්දුව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 24-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ වර්ධනය සඳහා කැපවුණු සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 25-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහඔවුන්ගේ පවුල් වල අයට ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 26-** දේව සේවය උදෙසා උනන්දුවක් ඇති උපකාර කරන්නන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 27-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සේවක පවුල් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 28-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය සඳහා නව පත්වීම් ලැබූ සහකාර කතෘවරිය සහ අප්‍රිකානු පුවත්පතේ සහකාර කතෘ තුමා ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 29-** කැඳවීමේ ප්‍රතිරාවය U Tube සමාජජාලය තුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීම වර්ධනය කරගැනීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**නොවැ: 30-** සබත් පාසල සඳහා දරුවන් උනන්දුවක් ඇතිව සම්බන්ධ වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ: 01-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේෂන් විදුහලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ සිසුන් සහ ගුරුවරුන්ගේ සුවය සහ ආරක්ෂාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ: 02-** නෙහෙමියා බයිබල් විදුහලේ 2024 අධ්‍යාපන වර්ෂයට නවක සිසුන් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**දෙසැ: 03-** දෙවියන්වහන්සේගේ බලවත් හස්තය කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම වැඩ කටයුතු සඳහා ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න.

**දෙසැ: 04-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කරන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 05-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිත කථාව ලිවීම වඩා ධෛර්යමත් වන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 06-** මිෂනාරිවරුන් සහ සභා පාලකවරුන් ගැන යාච්ඤා කරන්න

**දෙසැ: 07-** නෙහෙමියා බයිබල් විදුහලේ අවශ්‍යතා ගැන උනන්දුවකින් යාච්ඤා කරන්න

**දෙසැ: 08-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ සිසුන් සහ ගුරුවරුන්ගේ ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න

**දෙසැ: 09-** සියදිවි නසාගැනීමේ ආත්මය තරුණ ප්‍රජාව තුළින් දුරුවී යන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 10-** ස්වභාවික විපත්ති වලින් ලෝකය ආරක්ෂා කරන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 11-** ආගමික ප්‍රචණ්ඩත්වය නැතිව ගොස් සියලුරූ ආගම් අදහන්නන් අතර සාමය ඇති වන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 12-** දේව සේවය උදෙසා අරමුදල් සපයා ගැනීමට හැකිවන පිනිස උනන්දුවක් ඇතිව යාච්ඤා කරන්න

**දෙසැ: 13-** තරුණ තරුණියන් සහ කුඩා දරුවන් සිටින දෙමව්පියන් උදෙසා දිව්‍යමය මැදිහත්කම ඉල්ලා යාච්ඤා කරන්න

**දෙසැ: 14-** ලෝක කිතුණු සභාව තුළ බලවත් පිබිදීමක් අත්දකින පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 15-** ඉන්දියාවේ මනිපූර් ප්‍රදේශය තුළ නැවත සාමය ස්ථාපිත වන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 16-** ප්‍රධාන සභා සහ ශාඛා සභාවල සිටින සියලුරම ඇදහිලිවතුන්ට දිව්‍යමය සුවය සහ ආරක්ෂාව ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**දෙසැ: 17-** කැඳවීමේ ප්‍රතිරාවය ඔ ඔමඉ සමාජ ජාලය තුළින් ගැලවීම ලබාගත් සහලබාගන්නා අය ගැන යාච්ඤා කරන්න

**දෙසැ: 18-** "ග්ලෝබල් විෂන් ෆෝ යූත් ඇන්ඩ් කිඩ්ස් කෙයා" සේවය ගැන යාච්ඤා කිරීමට බරක් ඇති කිතුණුවන් ගැන යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මේ කොටසක් ලෙස දාවිත්ට ගොලියත් සමඟ මුහුණට මුහුණ හමුවීමට සැලැස්විය. යක්ෂයා නිතරම උත්සාහ කරනු ලබන්නේ අපගේ ජීවිතය කෙරෙහි තිබෙන්නාවූ දෙවියන්වහන්සේගේ සැලැස්ම විනාශකර දැමීමටයි. එබැවින් අප එයට ඉඩනොදී සෑම දෙයක්ම සිදුවන්නේ යහපත පිණිසය කියන සිතුවිල්ලෙන් යුතුව ක්‍රියා කරමු.

## (4). ආපසු හැරෙමු.

දාවිත් ඉතාම උනන්දුවෙන් හා ධෛර්‍යයමත් ලෙස කථාකල අවස්ථාවේදී ඔහු හඬක් ඇසුනි. 1 සාමුවෙල් 17:28 හි මෙසේ පවසයි. ***"ඔහු මිනිසුන්ට කථා කරන කල ඔහුගේ වැඩිමහල් සහෝදරවූ එලියාබ් අසාගෙන සිටියේය. එවිට එලයාබ් දාවිත් කෙරෙහි කෝප්වී, නුඹ ආවේ මොකටද? කාන්තාරයෙහි ඉන්න ඒ බැටළුවන් ස්වල්ප දෙනා නුඹ කාට භාරදී ආවාද? නුඹේ උඩඟුකමත් සිතේ මුරණ්ඩුකමත් මම දනිමි, නුඹ ආවේ යුද්ධය බලන පිණිස යයි කිවේය."*** දාවිත් යුද්ධය බැලීමට පමණක් ආවේය කියා එලියාබ් ඔහුට දොස් පවරනු ලැබීය. මෙය දාවිත්ව ඉතා වේදනාවට පත් කරනු ලැබීය. ඔහුගේ සහෝදරයා ඔහුට මෙලෙස සලකන්නේ ඇයි කියා දාවිත්ට තේරුම් ගැනීමට නොහැකි විය. ඔහු කිසිවක් කථා නොකර එම අවස්ථාව මගහැර යන්නට තීරණය කලේය. 1 සාමුවෙල් 17:29 සහ 30 යන කොටසෙහි ***දාවිත් එතැනින් හැරී වෙනතකට ගියාය*** පවසයි. සමහර වේලාවන්හිදී අපගේ ජීවිතයට මුහුණ දීමට සිදුවන විවිධ අවස්ථාවන් අප මගහරිමින් නැවත හැරී යා යුතුව ඇත. මන්ද අප ඉදිරියෙහි ඊටත් වඩා හොඳවූත් යහපත වූත් දෙයක් ඇත.

මෙම අවස්ථාවේදී දාවිත්ට තම සහෝදරයා හා සමඟ තර්ක කිරීමට හැකිව තිබුණු අතර ඒ සඳහා ඔහුට අයිතියක්ද තිබුණි. නමුත් තම සහෝදරයා සමඟ දබර නොකර එම ස්ථානයෙන් හැරී යාමට ඔහු තීරණය කලේය.

## (5). ඔබගේ සටන් බිම නාස්ති නොකරන්න.

ප්‍රිය මිත්‍රවරුනි, සමහර අවස්ථාවන් මහගැර දමා යන පිණිස අපට දෙවියන්වහන්සේගේ ප්‍රඥාව අත්‍යාවශ්‍ය වෙයි. දෙවියන්වහන්සේ ඔබ සෑම දෙනෙක්වම කැඳවා ඇත්තේ උන්වහන්සේගේ අනර්ඝ වූ සැලැස්මට අනුවය. එදා දාවිත්ට එලියාබ් පැවසූ වචන මෙන් ඔබගේ ජීවිතයටත් ඔබව රිදවන්නාවූ වචන ඇසෙන විට එම එලියාබ්ලා සමඟ දබර නොකර දෙවියන්වහන්සේ කෙරෙහි පමණක් අවධානය යොමු කර ගොලියත් නැමති පොදු සතුරා සමඟ සටන් නොකර අනවශ්‍ය දේ වලට අවධානය යොමු නොකර හැරී යා යුතුය.

එදා එලියාබ් විසින් කල චෝදනාව දෙස අපගේ අවධානය යොමු කරමු.

"ඔබ මෙතනට ආවේ ඇයි?"

"කාන්තාරයෙහි බැටළුවන්ව තබා ආවේ කා ළඟද?"

"ඔබගේ හදවත කොතරම් නපුරුද කියා මා දනිමි."

"ඔබ ආවේ යුද්ධය බලන්නට පමණක්මයි"



*Eliab asked questions to David*

මෙම සියලුම ප්‍රශ්න වලට පිළිතුරු දීමට දාවිත්ට අවස්ථාවක් තිබුණි. එසේ වුවා නම් ඔහු ගොලියත් සමඟ සටන් කිරීමට නොගොස් එලියාබ් සමඟ සටනට යාමට සිදුවෙනු ඇත. දෙවියන්වහන්සේ ඔබව ගොලියත් සමඟ සටන් කිරීමට කැඳවා තිබේ නම් ඔබගේ කාලය එලියාබ් සමඟ නාස්ති නොකරන්න. යුද්ධය එලියාබ් සමඟ නොව ගොලියත් සමඟයි. ඔබගේ කාලය නාස්ති නොකර ඔබ යුද්ධ භූමිය වෙත පියවර තබන්න.

## (6). ඉදිරියට දුවන්න.



අපි හැරී ඇවිදින්න ඕනි කුමන වේලාවේදීද? අප දුවන්න ඕනි කුමන වේලාවේදීද? යි කියා අප ඉගෙන ගනිමු. 1 සාමුවෙල් 17:48 වන පදය දෙස බලන විටදී අපට පෙනෙන්නේ, දාවිත් ගොලියත්ට විරුද්ධව දිව ගියේය කියාය. සියලු දෙනාම ගොලියත්ට භයවී දිවයන විට දාවිත් ඔහුට විරුද්ධව ඉදිරියට ගියේය. ඔබගේ සටන තෝරා ගන්න. ඔබට පැමිණෙන්නාවූ අධෛර්‍යයකම්, ඔබව වරදට පත් කරන්නාවූ දේවල්, බොරුව හා ඔබව ලැජ්ජාවට පත් කරන්නාවූ සෑම දේටම විරුද්ධව ඔබගේ කැඳවීම

කරා ඔබගේ අවධානය යොමු කරමින් ඔබගේ දිවීම දුවන්න. එය අත්හරින්න එපා.

දාවිත් මුල් කාලයේදී ඔහුගේ සටන තෝරා ගැනීමට ඉගෙන ගත්තේය. දාවිත්ගේ මුළු ජීවිත කාලය පුරාම ඔහුට විවිධ සටන් වලට මුහුණ දීමට සිදුවිය. යුද්ධ බිමෙහි පමණක් නොව ඔහුගේ සතුරන් සමඟ, පවුලේ සාමාජිකයන් සමඟ ඔහුට විවිධ යුද්ධයන් වලට මුහුණ දීමට සිදුවිය. නමුත් ඔහු කිසි විටකදීවත් එම යුද්ධයන් අත් හැරියේ නැත.

## (7). ඔබගේ සටන දෙවියන්වහන්සේ වෙතට යොමු කරන්න.

1 සාමුවෙල් 16 වන පරිච්ඡේදය දෙස බලන විටදී පරිනතවූ වැඩිමහල්ලෙක් වූ දාවිත්ව අපට දැකීමට හැකිය. ඔහු දැන් තම පුත්‍රවූ අබ්සලොම් කෙරෙන් පලා යමින් සිටී. මන්ද දාවිත්ගේ මෙම පුත්‍රයා ඔහුගේ රාජධානිය ඔහුගෙන් උදුරා ගත්තේය. දාවිත් තමාගේ මහලු කාලයේදී නිවාඩු ගත කිරීමට අවශ්‍යව සිටි විටදී ඔහුගේ ජීවිතය බේරා ගැනීම පිණිස ඔහු දුවමින් සිටී. මේ මොහොතේදී දාවිත් ශාරීරිකව හා මානසිකව මහත් පීඩනයකට පත්ව සිටියේය. ඔහු පලායන වේලාවේදී



*Shimei cursed David*

සාවුල්ගේ පවුලේ සාමාජිකයෙක් වූ ෂිමෙයි නම් පුද්ගලයා ඔහුට විරුද්ධව නරක වචන පාවිච්චි කරමින් දාවිත්ට ශාප කලේය.

***''....මිනීමරු මනුෂ්‍යය, දුර්ජන මනුෂ්‍යය, පලයන්, පලයන්. සාවුල් වෙනුවට රජවුණාවූ නුඹ පිටට ස්වාමීන්වහන්සේ සාවුල්ගේ පවුලේ සියල්ලන්ගේ ලේ පමුණුවා නුඹේ පුත්‍රවූ අබ්සලොම් අතට රජකම භාර දුන්සේක. ඔන්න, නුඹ විපත්තියට අසුවී ඉන්නෙහිය, මක්නිසාද නුඹ මිනීමරුවෙක්යයි කීවේය.'' (2 සාමුවෙල් 16:7-8)***

මෙවැනි අවස්ථාවේදී දාවිත්ගේ මනසෙහි කොපමණ වේදනාවක් ඇතිවෙන්නට ඇද්ද? ඔහු ඉශ්‍රායෙල් සෙනඟටත් සාවුල්ගේ පවුලේ වෙනු වෙනුත් කලාවූ දෙයට ලැබුණාවූ ප්‍රතිචාරය මෙයයි. තවමත් ඔහුට මිනීමරුවෙක්ය කියා අපහාස කලේය. දාවිත් මුහුණදුන්නාවූ වේදනාකාරී තත්වය ඉසිලුවාවූ අධි වේදනාව ගැන මා හට සිතා ගැනීමටවත් නොහැක. සමහර විට ඔබත් මෙවැනිම වූ වේදනාකාරී තත්වයන් තුළ ගමන් කරනවා ඇත. මා මනුෂ්‍යයන්ට කොතරම් යහපත කලත් ඔවුන්ගෙන් මට ලැබෙන්නාවූ ප්‍රතිචාරය හා ශාපයයි කියා සිතමින් වේදනාවට පත්වෙනවා ඇත.

දාවිත් සිටියාවූ ස්ථානයෙහි කවුරු හෝ සිටියත් ෂිමෙයිට විරුද්ධව සටන් කරන්නට ඇත. එම අවස්ථාවේදී දාවිත් ළඟ සිටි මනුෂ්‍යයන් මෙසේ පවසනු ලැබීය. ***''....අම මළ බල්ලා, මාගේ ස්වාමීවූ රජ්ජුරුවන්ට දොස් කියන්නේ මක්නිසාද? ගොස් ඔහුගේ හිස කපාදමන්ට මට අවසර ලැබේවා.'' (2 සාමුවෙල් 16:9)*** නමුත් මෙයට දාවිත් දුන්නාවූ පිළිතුර දෙස බලන්න. දාවිත් කථා කරමින් මෙසේ පවසනු ලැබීය. ***''සමහර විට මට කරන ලද අයුක්තිය දෙස ස්වාමීන්වහන්සේ බලා, අද***

*9 වෙනි පිටුවට....*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, **Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

### ස්වාමීන්වහන්සේගේ අරමුණ කිසිවෙටකත් වෙනස් නොවේ !

### NO PURPOSE OF HIS CAN BE WITHHELD FROM HIM!

1969 වර්ෂයේදී මගේ පුද්ගලික ගැලවුම්කරු ලෙස යේසුස් වහන්සේ පිළිගත් පසු පාස්ටර් එස්. දේවදාසන් සමඟ සේවයට එකතුවුයෙමි. මේ කාලය තුලදී ඔහු පෙරමග දූතයා නැමති සඟරාවේ කර්තෘ ලෙස ක්‍රියා කරමින් සිටියේය. දෙවියන්වහන්සේට සේවය කරන පිණිස ඔහු වසර 3 ක් ආත්මික ලෙස මා හට යහපත් පුහුණුවක් ලබා දුන්නේය.



*Pr. S. Sam Selva Raj & Rev. S. Devadasan*

එක් දිනක් රාත්‍රියේදී මා ඔහු සමඟ දිගු වේලාවක් යාච්ඤා කලෙමි. එවිට ඔහු ක්ෂණිකවම අනාගතයේදී මේ ලෝකයට සිදු වෙන්නේ මොනවාද කියා පැවසූ අතර දෙවියන්වහන්සේ මා තුලින් කරන්න යන්නේ මොනවාද කියාත් පැවසුවේය. ඔහු ඉතා මහත් බලවත් වූ දේ සිදුවෙන්නට යන බව ප්‍රකාශ කල මුත් එම අවස්ථාවේදී ඒවා සිදුවෙයිද කියා මා හට හීනෙන්වත් සිතා ගැනීමට නොහැකි විය. මට ඉතා හොඳ අධ්‍යාපන සුදුසුකමක් තිබුනේ නැත. මා සතුව මුදල් තිබුනේද නැත. මනුෂ්‍යයන්ගේ උදවු උපකාරයන්ද තිබුනේ නැත. නමුත් මේ සියලුම දේ අනාගතයේදී සිදුවෙන්නට යනවාය කියා පැවසීය.

මගේ නොහැකියාව ගැන මා ඔහුට මෙසේ පැවසුවෙමි. ''පාස්ටර්, මේ විදිහටම දෙවියන්වහන්සේට සේවයක් කලොත් මට ඇති.'' එවිට ඔහු මට මෙසේ පිළිතුරු දුන්නේය. ''සාමාන්‍ය පුද්ගලයෙක්ව උසස්ම ස්ථානයකට ගෙනයාමට කරුණු 2 ක් අවශ්‍ය වෙනවා. එනම්, ඇදහිල්ල හා යහපත් හෘර්ද සාක්ෂියයි. මෙය 1 තිමෝති 1:19 වන පදයෙහි සඳහන් කර තිබෙනවා. ඔබ මේ දේවල් පිළිපදිනවා නම්, ඔබගේ ඇස් ඒ දේ කෙරෙහි පමණක් යොමු කරනවා නම් මේ සියලුම ආත්මික උසස්වීම් ඔබට ලැබෙයි'' කියාය. මෙම වසර ගණනාවක් පුරාවටම ඇදහිල්ල හා යහපත් හෘර්ද සාක්ෂියක් ඇතිව ක්‍රියා කිරීමට මා හට හැකි විය.

මෙම සඟරාව ලිවීමට පෙර දෙවියන්වහන්සේගේ සියුම් වූ හඬින් මා හට කථා කලේය. උන්වහන්සේ මට කථා කරමින්, ''මාගේ පුත්‍රය, ඔබ සිටගෙන ඉන්නාවූ ගොඩනැගිල්ල දෙස බලන්න. මෙය ඔබට ලැබුනේ කෙහොමදඃ දැනට ඔබ මෙම ගොඩනැගිල්ල තුළ කරගෙන යන්නාවූ පහත මහලය තුළ තිබෙන මුද්‍රණාලය දෙස බලන්න. උඩුමහලේ තිබෙන්නාවූ පැය 24 පුරා පවත්වාගෙන යනු ලබන යාච්ඤා සේවය දෙස බලන්න. නෙහෙමියා බයිබල් විදුහලේ සේවය, තරුණ සේවය ගැන සිතන්න. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ පරිපාලන කටයුතු කරන්නාවූ කාර්යාලය තිබෙන ස්ථානය දෙස බලන්න.''

''ඔබගේ ප්‍රමාණයට වඩා ඉහළින් ඔබ මේ සියලුම සේවාවන් කරගෙන යනවා. ඔබට බොහෝ ආරොන්ලා සහ යොෂුවලා දී තිබේ. ඔබ මේ සියලුම ආශිර්වාදයන් ගැන නොසිතුවත් මා ඔබ ගැන ඉතා උසස් ලෙස සිතමි. මා ඔබව කැඳවූ අවස්ථාවේදී ඔබ සිටියේ කොහොමද? අද ඔබ සිටින්නේ කෙසේද? මා ඔබගේ සේවයට තවත් ආශිර්වාද කරනවා. බොහෝ දේව දාසයින් හා පාස්ටර් දේව දාසන් ඉගැන්වූ ලෙස ඔබත් ඇදහිල්ලෙන් හා යහපත් හෘර්ද සාක්ෂිය තුළ ස්ථිරව සිටින්න. අධෛර්‍යයට පත් නොවන්න. ඔබගේ ජීවිතයේ අමාරු කාලයන් හා ප්‍රශ්ණකාරී වාතාවරනයන් තුලින් ගමන් කරන විට ඔබව කැඳවූයේ මා බව සිහි කරන්න. මාගේ මුඛයෙන් පැවසූ සියලු පොරොන්දු මා ඔබට ඉෂ්ඨ කරමි. කල නොකිරෙන්න. ධෛර්‍යයමත්ව සිටින්න.''

සමහර අවස්ථාවන් වලදී ඔබට මේවා සම්පූර්ණයෙන්ම තේරුම් ගැනීමට අසීරු විය හැකිය ස්වාමීන්වහන්සේ කොපමණ පුදුම මහත්වූ දේ කර තිබේද? ප්‍රිය සහෝදරයා සහෝදරිය, ඔබගේ නායකයින්ට කීකරු වෙන්න. ඔබගේ නායකත්වයට යටත් වී ඇදහිල්ල හා යහපත්වූ හෘර්ද සාක්ෂිය ඉතා ඉහළ මට්ටමක තබා ගන්න. ඔබ දෙවියන්වහන්සේ ඉදිරියෙහිත් ඔබගේ නායකයන් ඉදිරියෙහිත් අවංක නම් ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේ මහත් වූ දේ කරනු ඇත. දෙවියන්වහන්සේ ඔබ තුලින් කිරීමට යන්නාවූ මහත් වූ දේ නතර කිරීමට කිසි කෙනෙකුට නොහැකිය. සියලු මහිමය හා ගෞරවය ස්වාමීන්වහන්සේට මා පුද කරමි.

*******

## PLEASE PRAY FOR OUR MINISTRIES AT THE HEAD QUARTERS

| | | |
|---|---|---|
| 1. | Prayer Service | : 24 hours |
| 2. | **BIBLECOR** - Bible Correspondence Courses : English, Tamil & Hindi | |
| 3. | **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan. | |
| 4. | Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential) | |
| 5. | Theological Correspondence Courses: English & Tamil | |
| 6. | Great Commission Partners (Network of Pastors) | |
| 7. | Training Programmes | |
| 8. | Crusades | |
| 9. | Literature Distribution and Follow Up | |
| 10. | Gospel Printing Press | - Publications |
| 11. | St. Paul's Matriculation School | - Village English High School |
| 12. | Sunday Schools | : 8.30 a.m. & 4.00 p.m. Sunday |
| 13. | **Tamil Services** | : **8.00 a.m. & 10.00 a.m. Sunday** |
| 14. | **Hindi Service** | : **4.00 p.m. Sunday** |
| 15. | **Telugu Service** | : **5.00 p.m. Sunday** |
| 16. | **English & Tamil Service** | : **6.00 p.m. Sunday** |
| 17. | Women's Prayer | : 5.30 p.m. Wednesday |
| 18. | Men's Prayer | : 7.00 p.m. Friday |
| 19. | Discipleship Meeting | : 6.00 p.m. Saturday |
| 20. | House Meetings | : 6.30 p.m. Tuesday & Thursday |
| 21. | Special Holy Communion | : 6.00 a.m. 1st day of each month |
| 22. | Ministers Review Meeting | : 5.30 p.m. First Saturday |
| 23. | Parents' Prayer | : 4.00 p.m. First Sunday |
| 24. | Night Prayer | : 9.30 p.m. Second Friday |
| 25. | Fasting Prayer | : 9:30 a.m. Third Saturday |
| 26. | Holy Communion | : Second Sunday Services |
| 27. | Youth / Kid Prayer | : 10.00 p.m. daily |
| 28. | Staff Devotion | : 9.00 a.m. daily |
| 29. | Office | : 9.00 a.m. to 9.00 p.m. (except Sundays) |

*7 පිටුවෙන්....*

***දවසේ ඔහුගේ දොස් කීම වෙනුවට මට යහපත කරනවා ඇත.'' (2 සාමුවෙල් 16:12)*** මෙහිදී දාවිත් ප්‍රකාශ කරනු ලැබූයේ දෙවියන්වහන්සේ ඔහුගේ සියලු වේදනාවන් දුටු බවයි. 2 සාමුවෙල් 16:11 වන පදයෙහි දාවිත් මෙසේ පවසයි. ***''....ඔහු නිකම් උන්නාවේ, දොස් කීවාවේ, මක්නිසාද එසේ කරන්ට ස්වාමීන්වහන්සේ ඔහුට කීසේක.''*** අපට මෙවැනිවූ ස්ථිරත්වයක් තිබිය යුතුය. එනම් මගේ ජීවිතය ස්වාමීන්වහන්සේට ඉඩහරින්නේ නැතිනම්, කිසි දෙයක් සිදුවන්නේ නැත. උන්වහන්සේ යමකට ඉඩහරින්නේ නම්, අවසානයේදී එය මට ආශිර්වාදයක් වෙයි.

ප්‍රිය මිත්‍රවරුනි, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පවා උන්වහන්සේගේ සටන තෝරාගත්තේය. උන්වහන්සේගෙන් මනුෂ්‍යයන් ප්‍රශ්න කල විටදී උන්වහන්සේ නිහඬව සිටියාය කියා දේව වචනයෙහි සඳහන් කර ඇත. එසේම දෙවියන්වහන්සේට අපගේ සටන සටන් කරන්නය කියා අප නිහඬව බලා සිටිමු. ඔබගේ ජීවිතයේ සටන තෝරා ගැනීමට දෙවියන්වහන්සේගේ කරුණාව ඔබට ලැබේවා!

*******

RNI NO. TN/SIH/2006/17846

## NEED LIBRARY BOOKS

We are in need of **Tamil,, English and Hindi books** for our Libraries at **St. Paul's Matriculation School and Nehemiah Bible Colleges.** If you have new or old books in good condition and If you have new or old books in good condition and are willing to donate, please get in touch with us.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## URGENT

We need about 1000 Hindi Christian Books for our Nehemiah Bible Colleges. Please inform us the possibility of procuring the theological Hindi books.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/-
ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd NOVEMBER 2023.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**